1. පාසලක පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධ ක්‍රියාවලිය මාර්ගගතව කිරීමට පාසලක් සැලසුම් කරයි. ඒ අනුව භාරකරු විසින් මාර්ගගත ක්‍රමයට අයදුම්පත ඉදිරිපත් කළ යුතුය. පාසල් පද්ධතිය සිසුන් ඇතුලත් කිරීමේ අයදුම්පත් පාසල් තේරීම් කමිටුව වෙත ඉදිරිපත් කෙරෙනු ඇත.කමිටුව මගින් පිළිගත් හා ප්‍රතික්ෂේප කළ අයදුම්පත් පිළිබඳ විස්තර පද්ධතියට ඇතුළත් කරයි. පද්ධතිය මගින් ඒ බව භාරකරුට දැනුම් දෙයි. පසුව සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලබන දිනය හා වේලාව කමිටුව පද්ධතියට දැනුම් දෙනු ලබයි. සම්මුඛ පරීක්ෂණයට අදාල තොරතුරු කමිටුව වෙත ලබාදෙන අතර තේරීපත්වන ළමුන්ගේ ලැයිස්තු කමිටුව අනුමත කොට පද්ධතියට එක් කෙරේ. එය භාරකරු විසින් ලබාගෙන තේරී පත්වී ඇත්නම් ලියාපදිංචිය සඳහා විස්තර හා ගාස්තුව පද්ධතියට යොමුකරයි. පද්ධතිය මගින් රිසිට්පතක් සමඟ තේරී පත් වන පන්තිය භාරකරුට දැනුම් දෙනු ලැබේ. සිද්ධියට අදාළ සන්දර්භ රූප සටහන පහත දැක්වේ.



a. A,B,C,D,E ට අදාල වගන්ති ලියා දක්වන්න.

b. සිද්ධියට අදාළ දත්ත ගැලීම් සටහනෙහි පළමු මට්ටමේ රූප සටහන අඳින්න.

c. සිද්ධියට අදාළ කාර්යබද්ධ අවශ්‍යතා තුනක් ලියන්න.

d. එම සිද්ධියට කාර්යබද්ධ නොවන අවශ්‍යතා දෙකක් ලියන්න.